# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

## Primary Piriven Year End Term Test - 2016

4 වසර / Grade 4

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**සංස්කෘත**
**Sanskrit**

කාලය : පැය තුනයි
Time : Three hours

01, 02, 03, ඇතුළු ව ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.

01. කෙටි පිළිතුරු සපයන්න.

I. මහ ප්‍රාණාක්ෂර ලියා දක්වන්න.

II. අව්‍යය පද කීය ද? ඒවා මොනවා ද?

III. අඝෝෂාක්ෂර ප්‍රත්‍යාහාර ක්‍රමයට ලියා දක්වන්න.

IV. අනාගතකාලයට අයත් ලකාර 03ක් නම් කරන්න.

V. නාමයක් නාමපදයක් බවට පත්වන්නේ කෙසේ ද?

VI. සංස්කෘත භාෂාවේ සන්ධි වර්ග කීය ද? ඒවා මොනවා ද?

VII. **ए , ऐ , ओ , औ** යන අක්ෂර හඳුන්වන්නේ කුමන නමින් ද?

VIII. සංස්කෘත භාෂාවේ නාම විභක්ති කීය ද? ඒවා මොනවා ද?

IX. **गङ्गा, अस्थि, नर** යන ශබ්ද කුමන ලිංගවලට අයත්ද යි පිළිවෙළින් ලියා දක්වන්න.

X. " **अनन्तपारं किल शब्दशास्त्रं** " යන්නෙන් ආරම්භ වන ශ්ලෝකය සම්පූර්ණ කොට ලියා දක්වන්න.

(ලකුණු 3 x 10 = 30යි)

02. පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

आकारैरिङ्गितैर्गत्या चेष्टया भाषणेन च ।
नेत्रवक्त्रविकारैश्च लक्ष्यतेऽन्तर्गतं मनः ॥

तदद्यैनं भयाकुलं प्राप्य स्वबुद्धिप्रभावेण निर्भयं कृत्वा वशीकृत्य च निजां साचिव्यपदवीं समासादयिष्यामि ।' करटक आह – 'अनभिज्ञो भवान्सेवाधर्मस्य। तत्कथमेनं वशीकरिष्यसि।' सोऽब्रवीत् – 'कथमहं सेवानभिज्ञः। मया हि तातोत्सङ्गे क्रीडताभ्यागतसाधूनां नीतिशास्त्रं पठतां यच्छ्रुतं सेवाधर्मस्य सारभूतं हृदि स्थापितम्। श्रूयताम्। तच्चेदम्-

सुवर्णपुष्पितां पृथ्वीं विचिन्वन्ति नरास्त्रयः।
शूरश्च कृतविद्यश्च यश्च जानाति सेवितुम्॥

(ලකුණු 20යි)

03. පහත දැක්වෙන ශ්ලෝකයන්හි සිංහල අදහස ලියන්න.

०१. समजनि भगवान् स्वयं स्म यस्मिन्
सकलमबोधि च यत्र धर्मचक्रम्।
विशदतरमदीपि यत्र यस्मिन्
नमृतमपूरि तदप्यहं नमामि ॥

०२. सर्वज्ञवक्त्रसरसीरुहराजहंसम्
कुन्देन्दुसुन्दररुचिं सुरवृन्दवन्द्यम् ।
सद्धर्मचक्रसहजं जनपारिजातम्
श्रीदन्तधातुममलं प्रणमामि भक्त्या ॥

०३. नागालयोपरिधरालयचक्रवाल
मूर्ध्नि त्रिकूटगतकाञ्चनशैलशृङ्गे ।
बोधिद्रुमूलनिहिता क्षयधातुबिम्बम्
बिभ्रन्नमामि सिरसा जिनचैत्यमग्रम् ॥

०४. हैमालवालवलयान्तररत्नवेदी
वज्रासनोल्लसितमूलमहेन्द्रबोधिम्।
यं प्राप्य मारविजया नुपदं प्रपेदे
सर्वज्ञतां स भगवान् तमहं नमामि ॥

(ලකුණු 5 x 4 = 20යි)

04. පහත සඳහන් වාක්‍ය සිංහලයට නඟන්න.

१. त्यज दुर्जन संसर्गं।
२. वयं ग्रामम् आगच्छाम।
३. शृगालः परेषां वञ्चने नितरां पटुः।
४. गृहपतयः याचकेभ्यः वस्त्राणि वितरन्ति।
५. लोभेन बुद्धिश्चलति लोभो जनयते तृषाम्।

(ලකුණු 3 x 5 = 15යි)

05. පහත සඳහන් වාක්‍ය සංස්කෘතයට නඟා දේවනාගරී අකුරින් ලියන්න.

1. මේ ජීවිතය නිසරු ය.
2. පරහට වැඩ පිණිස ගස් එලදරයි.
3. විලේ මැදෙහි පද්මයෝ හටගනිති.
4. මිත්‍රය, සත්පුරුෂයන් ඇසුරු කරන්න.
5. සුදොවුන් රජුගේ පුත් කුමරු බුදු වන්නේ ය. (ලකුණු 3 x 5 = 15යි)

06. I. ऊ කාරාන්ත ස්ත්‍රී ලිංග **वधू** ශබ්දය **හෝ** अ කාරාන්ත නපුංසක ලිංග **मित्र** ශබ්දය **සියලු විභක්තීන්හි** වරනඟන්න.

II. **√नम्** ධාතුව **लृट्** ලකාර **පරස්මෛපදයෙහි වරනඟා** දක්වන්න.

(ලකුණු 7½ x 2 = 15යි)

07. පහත දැක්වෙන සූත්‍ර අතරින් **03ක් සනිදර්ශනව** හඳුන්වන්න.

१. ए अय्।

२. आ इ ए।

३. इयं स्वरे।

४. ञमे ञमा वा।

५. चपा अबे जबाः।

(ලකුණු 5 x 3 = 15යි)

08. ''භක්තිශතක කවියා ශ්‍රී සද්ධර්මය ලොවට කියාදෙයි'' භක්තිශතකය ඇසුරින් විමසන්න.

**නැතහොත්**

''සත්ත්ව චරිත උපයෝගී කරගනිමින් පඤ්චතන්ත්‍ර කතුවරයා සමාජ සිරිත් විරිත් මැනවින් උගන්වයි'' සනාථ කරන්න.

(ලකුණු 15යි)

The National e-learning Portal for The General Education

*　　*　　*